# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2189/53 - 2020 අගෝස්තු මස 22 වැනි සෙනසුරාදා - 2020.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47 (v).

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාන ආඥපනතේ 6 (2) (ආ) සහ 21 (2) (ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මේ නියමය මගින්,

(අ) ඉහත කී ආඥපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "ඇඹුල්ගම රජමහා විහාර භූමිය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ;

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ ඇඹුල්ගම රජමහා විහාර භූමිය සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ ; සහ

(ඇ) 2008 ඔක්තෝබර් මස 20 වැනි දිනැති අංක 1572/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත කී ආඥපනතේ 6 (2) (ආ) සහ 21 (2) (ආ) වගන්ති යටතේ සාදන ලද නියමය පරිච්ඡින්න කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

1A - G 32646 — 36 (2020/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

***ඇඹුල්ගම රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

සර්වේ ජනරාල්ගේ 2008 ජූනි මස 25 දිනැති අංක CO/HMG/07/586 දරන අනුරේඛනයේ කැබලි අංක 1, 2 සහ 3 වශයෙන් නිරූපිත බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජල්තර සහ හේන්පිට ග්‍රාමයන්ගේ පිහිටි හෙක්ටයාර් 4.19968ක විශාලත්වයෙන් යුත් පහත සඳහන් පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය.

**කැබලි අංක 1**

| | | |
|---|---|---|
| උතුරට | : | ඩී. සී සමරතුංග හා වෙනත් අය සහ කේ. ටී. විජේරත්න හිමිකම් කියන බටදෙඹගහවත්ත ; |
| නැගෙනහිරට | : | කේ. ටී. විජේරත්න හිමිකම් කියන බටදෙඹගහවත්ත, මාර්ගය, පඩිපෙල, ශ්‍රියාලතා විතාන සහ වෙනත් අය හිමිකම් කියන බටදෙඹගහවත්ත, එල්. ආර්. ස්වර්ණා මැණිකේ හිමිකම් කියන බටදෙඹගහවත්ත, බටදෙඹගහවත්ත හිමිකම් නොදන්නා ආර්. ඒ. ලීලාවතී හිමිකම් කියන බටදෙඹගහවත්ත ; |
| දකුණට | : | අඩි පාර, ඒ. වී. ඇලිස්නෝනා සහ කේ. ඩී. එස්. පෙරේරා හිමිකම් කියන බටදෙඹගහවත්ත ; |
| බස්නාහිරට | : | මාර්ගය. |

**කැබලි අංක 2**

| | | |
|---|---|---|
| උතුරට | : | ප්‍රින්සි අත්තනායක හා වෙනත් අය, ඒ. ඒ. පී. මංජුල, කේ. රම්‍යලතා, එස්. ඒ. රංජනී හිමිකම් කියන ඇඹුල්ගන්කන්ද සහ ඒෂියන් ෆිනෑන්ස් හිමිකම් කියන ප්ලැසිඩ් වීව් ; |
| නැගෙනහිරට | : | මාර්ගය සහ කැබලි අංක 13 ; |
| දකුණට | : | කැබලි අංක 13 සහ 3 ; |
| බස්නාහිරට | : | කැබලි අංක 3, ප්‍රින්සි අත්තනායක සහ වෙනත් අය සහ ඒ. ඒ. පී. මංජුල හිමිකම් කියන ඇඹුල්ගන්කන්ද. |

**කැබලි අංක 3**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 2 ; |
| නැගෙනහිරට | : | කැබලි අංක 2 සහ 13 ; |
| දකුණට | : | කැබලි අංක 13 සහ 12 ; |
| බස්නාහිරට | : | කැබලි අංක 6, 5, 4, 13 සහ ප්‍රින්සි අත්තනායක හා වෙනත් අය හිමිකම් කියන ඇඹුල්ගන්කන්ද. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.